PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

සභාපතිතුමා,
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
17.09.2024

**PAF/2024PE/C/149**

ගරු සභාපතිතුමනි,

**<u>මැතිවරණ නීති උල්ලංඝනය කිරීමක් සම්බන්ධවයි.</u>**

අඩු ආදායම්ලාභීන්ට ලබාදෙන අස්වැසුම සහනාධාරය ලබාගත් ප්‍රතිලාභීන්ගේ ජංගම දුරකතන වලට ජනාධිපති අපේක්ෂක රනිල් වික්‍රමසිංහ මහතාට ඡන්දය ලබා දෙන ලෙස දුරකථන ඔස්සේ පණිවිඩයක් එවන බවට අප වෙත පැමිණිල්ලක් ලැබී ඇත.

එහි පළමු පියවරේදී ටික වේලාවකින් ඔබගේ ජනාධිපතිවරයාගෙන් ඇමතුමක් බලාපොරොත්තු වන්න (http://www.rw.lk) යනුවෙන් පණිවිඩයක් ලැබෙන අතර දෙවන අදියරේ දී ජනාධිපති අපේක්ෂක රනිල් වික්‍රමසිංහ මහතාගේ පටිගත කළ හඬ පටයක් පහත සඳහන් අංකය මගින් වාදනයවේ. (0714354512)

එම හඬ පටය මගින් ප්‍රකාශ වන්නේ අස්වැසුම 21 දිනයෙන් පසුවත් ලබා ගැනීමට නම් ගෑස් සිලින්ඩරය ඉදිරියේ ඡන්දය සලකුණු කරන ලෙසයි.

මෙය පැහැදිලි ලෙසම මැතිවරණ නීති උල්ලංඝනය කිරීමක් බැවින් මේ පිළිබඳ සොයා බලා සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙයට විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි (වෙනුවට)
විධායක අධ්‍යක්ෂක

පිටපත් : සියලුම මාධ්‍ය ආයතන වෙත

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com